**ශීර්ෂය 7 - අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 7 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 20 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධි විධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු වී තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1 |
| | | 2. කාර්යසාධනයේ අඩුපාඩු | |
| | | 3. අධි ප්‍රතිපාදනය සලසා තිබීම | 2.2 |
| | | 4. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.4 |
| | | 5. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.6 |
| | | | 2.5 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම. | 2.7 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.8 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘත හස්තතාවය හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියාකලහැකිවන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියලු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

------------------------------------------------

### 2.1 සැලැසුම් කිරිම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම තුළ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කර ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්ම තුළ ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 කාර්යසාධනය

--------------

සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව සම්බන්ධව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන කාර්යයන්ගෙන් ආවරණය කර තිබුණේ වර්ෂය තුළ සාමාන්‍ය පරිපාලන, වැටුප් හා ගමන් වියදම්, මානව සම්පත් කළමනාකරණ, මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට විද්‍යුත් තැපැල ස්ථාපිත කිරීම, නඩත්තු හා වෙනත් සේවා, මිලදී ගැනීම් හා පුහුණු වැඩසටහන් සඳහා දැරීමට සිදුවන වියදම් පමණක් වූ අතර ප්‍රධාන අරමුණු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාලව පහත (i), (ii) කරුණු සම්බන්ධව විගණන අධිකාරිගේ සමාංක JPA/B/JSC/2015/154(6) දරන හා 2016 සැප්තැම්බර් 06 දිනැති ලිපියෙන් තොරතුරු ඉල්ලා සිටියද එම තොරතුරු ලබාදීමට අපහසු බව දක්වමින් නීතිපතිවරයාගේ සමාංක AG/28/2016 හා 2016 සැප්තැම්බර් 27 දිනැති ලිපියෙන් දැන්වීමක් කර තිබුණි. එසේම 2017 ජනවාරි 16 දිනැති අංක JPA/පොදු/2017/03 ලිපියෙන්ද කාර්යසාධන විගණනයට අදාල තොරතුරු ලබාදෙන ලෙස කළ ඉල්ලා තිබුණි. නීතිපති තුමා විසින් දෙන ලද තීරණය අනුව, මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ සම්බන්ධයෙන් එසේ විමසා ඇති තොරතුරු සැපයීමට අධිකරණ සේවා කොමිෂන් සභාව බැඳී නොමැති බව එම කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම්ගේ අංක MOJ/Reports හා 2017 පෙබරවාරි 16 දිනැති ලිපියෙන් දැනුම් දී තිබුණි. එසේම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ලබාදීම අවශ්‍ය නොවන බවද දන්වා තිබුණි. මෙම කරුණු හේතුවෙන් 2016 වර්ෂයට මෙන්ම සමාලෝචිත වර්ෂයටද අදලාව පහත (i, ii) දක්වා ඇති කරුණු සම්බන්ධව කාර්යසාධනය පරීක්ෂා කළ නොහැකි විය.

(i) අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන් පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාවේ යෙදීම, මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ස්ථාන මාරු කිරීම් පිළිබඳ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය පරීක්ෂා කිරීම.

(ii) 2017 කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයට අදාල අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්යසාධනය පිළිබඳ සාරාංශ සටහන් දක්වා ඇති අතර ඒ පිළිබඳව පරීක්ෂාව, නඩු විසඳීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දක්වා ඇතත්, (අවුරුදු 10 ට වඩා පැරණි නඩු ඇති අධිකරණ හඳුනාගෙන එම අධිකරණ

වෙත නඩු කඩිනමින් විසඳීමට චක්‍රලේඛ නිකුත් කිරීම හා උපදෙස් ලබා දීම) ඒ පිළිබඳ පරීක්ෂාව, නිම කර තිබූ පැරණි නඩු පිළිබඳව පරීක්ෂා කිරීම.

**2.3 වත්කම් කළමනාකරණය**

කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

කොමිෂන් සභාව සතු මෝටර් රථයක් හා යතුරුපැදියක් පිළිවෙලින් 2017 වර්ෂයේ සහ 2016 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර, එම වාර්තා 2018 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, කොමිෂන් සභාව එසේ කටයුතු කර නොතිබුණි.

**2.4 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ සඳහා කොමිෂන් සභාවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 36.67 | 32.86 | 3.81 | 10.39 |
| | මූලධන | 1.28 | 0.96 | 0.32 | 25.00 |
| | **එකතුව** | 37.95 | 33.82 | 4.13 | 10.88 |
| 2014 | පුනරාවර්තන | 37.51 | 34.12 | 3.39 | 9.04 |
| | මූලධන | 1.46 | 1.05 | 0.41 | 28.08 |
| | **එකතුව** | 38.97 | 35.17 | 3.80 | 9.75 |
| 2015 | පුනරාවර්තන | 41.69 | 36.89 | 4.80 | 11.51 |
| | මූලධන | 1.08 | 0.91 | 0.17 | 15.74 |
| | **එකතුව** | **42.77** | **37.80** | **4.97** | **11.62** |
| 2016 | පුනරාවර්තන | 47.70 | 44.83 | 2.87 | 6.02 |
| | මූලධන | 0.70 | 0.58 | 0.12 | 17.14 |
| | **එකතුව** | **48.40** | **45.41** | **2.99** | **6.18** |
| 2017 | පුනරාවර්තන | 60.50 | 55.37 | 5.13 | 8.47 |
| | මූලධන | 10.44 | 8.13 | 2.31 | 22.13 |
| | **එකතුව** | **70.94** | **63.50** | **7.44** | **10.49** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදනය සලසා තිබීම**

වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 51 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කොමිෂන් සභාව විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

**2.6 අභ්‍යන්තර විගණනය**

ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බව මුදල් රෙගුලාසි 133 මගින් අවධාරණය කර ඇතත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. ඒ සඳහා කාර්ය මණ්ඩලය අනුමත වී ඇතත් මෙතෙක් එම කාර්ය මණ්ඩලය ලබාදී නොතිබුණි.

**2.7 විගණන හා කළමනාකරණ කමිටුව**

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කළ යුතු නමුත් කොමිෂන් සභාවේ විගණන හා කළමණාකරන කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**2.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 43.49 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 12 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ද්විතියික මට්ටම | 73 | 37 | 36 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 25 | 18 | 07 |
| | එකතුව | 117 | 70 | 47 |

ආයතනයේ අරමුණු හා කාර්යභාරය ඉටු කිරීමට සෘජුවම දායකත්වය ලබාදෙන ජ්‍යෙෂ්ඨ, තෘතීයික හා ද්විතීයික මට්ටමේ තනතුරු 40 ක පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 43 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.